# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 ඔක්තෝබර් 19 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2021 අගෝස්තු

## සමස්ත නිරීක්ෂණ

මූල්‍ය ලැබීම් ඉහළ යාම හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයේ දී දළ නිල සංචිත ඉහළ ගිය අතර, අඛණ්ඩව තුන්වන වරටත් මෙම මාසයේ දී ද වෙළඳ භාණ්ඩ අපනයන එ.ජ. ඩොලර් බිලියන 1.0 ඉක්මවිය. කෙසේ වෙතත්, භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම ඉහළ යාමට වඩා වැඩි වේගයකින් ආනයන වියදම ඉහළ යාම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වෙළඳ හිඟය පුළුල් විය. 2021 වසරේ අගෝස්තු මාසයේ දී සංචාරක පැමිණීම් පෙර මාසයට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් යම් වැඩිවීමක් පෙන්නුම් කළ අතර, මුළු සංචාරක පැමිණීම් සංඛ්‍යාව අඩු මට්ටමක පැවතුණි. 2021 වසරේ අගෝස්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල අඩු වීමක් පිළිබිඹු විය. 2021 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) වෙන්කිරීම් යටතේ ශ්‍රී ලංකාවට අදාළ කොටස අගෝස්තු මාසයේ දී ලැබුණි. තවද, 2021 වසරේ අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ බංගලාදේශ බැංකුව අතර ඇති කර ගත් ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු ගිවිසුම යටතේ මූලික අදියරේ විනිමය හුවමාරු වීම සිදු විය. අන්තර් බැංකු වෙළඳපොළේ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය 2021 වසරේ අගෝස්තු මාසයේ දී සමස්තයක් ලෙස ස්ථාවරව පැවතුණු අතර, මාසය අවසානයේ දී විනිමය අනුපාතිකය මත යම් පීඩනයක් නිරීක්ෂණය වීම හේතුවෙන් රුපියල ස්ථාවර කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වීමට සිදුවිය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2020 අගෝස්තු එ.ජ.ඩො. මිලියන | 2021 අගෝස්තු එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2020 ජන. - අගෝ. එ.ජ.ඩො. මිලියන | 2021 ජන. - අගෝ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 947 | 1,100 | 16.2 | 6,445 | 7,903 | 22.6 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,289 | 1,687 | 30.8 | 10,257 | 13,411 | 30.7 |
| වෙළඳ ශේෂය | -342 | -586 | | -3,812 | -5,509 | |
| සංචාරක ඉපැයීම් | - | 7 (ඇ) | - | 682 (ආ) | 33 (ඇ) | -95.2 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 664 | 447 | -32.8 | 4,346 | 4,224 | -2.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -44 | -16 | | -173 | -181 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 118 | - (ඉ) | | 1,433 | 1,233 (ඊ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (දළ) | 1 | - | | 91 | 16 | |
| දිගුකාලීන ණය (දළ) | 117 | ලැනො. | | 1,341 | 1,218 (ඊ) | |
| විදේශ සෘජු ආයෝජන (දළ) (උ) | | | | 351 | 398 | |
| සමස්ත ශේෂය | | | | -722 | -2,423 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයීක ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) 2021 අගෝස්තු මාසයේදී රාජ්‍ය අංශයේ දළ ලැබීම් අතරට විදේශීය ණය ඇතුළත් නොවේ.
(ඊ) දිගු කාලීන ණය සඳහා සමුච්චිත දත්තවලට විදේශීය ණය ඇතුළත් වන්නේ 2021 ජූලි මාසය දක්වා පමණි.
(උ) සෑම වසරකම පළමු මාස හය සඳහා දත්තවලට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ ශේෂය හා වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** වෙළඳ ගිණුමේ හිඟය, 2020 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 342 ක හිඟයට සාපේක්ෂව, 2021 වසරේ අගෝස්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත එ.ජ. ඩොලර් මිලියන 586ක් දක්වා පුළුල් විය. 2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ සමස්ත වෙළඳ ගිණුමේ හිඟය ද, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,812ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 5,509ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ සමස්ත හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයේ දී සියයට 19.2කින් පහළ ගිය අතර, 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව, අපනයන මිල ගණන් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2021 වසරේ ජනවාරි - අගෝස්තු කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම**
**(අගයයන් එ.ජ. ඩොලර් මිලියනවලිනි)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2020-2021)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2020-2021)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන**: **2021 වසරේ අගෝස්තු මාසයේ දී අපනයන ආදායම 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,100ක් දක්වා සියයට 16.2කින් ඉහළ ගිය අතර, එය අගෝස්තු මාසයක දී වාර්තා වූ ඉහළම අගයකි.** 2021 වසරේ ජූලි මාසයේ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,104ක සුළු වශයෙන් ඉහළ අගයකි. 2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා සමස්ත අපනයන ආදායම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 6,445ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,903ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත් වෙළඳ භාණ්ඩ අපනයනය සහ එම අපනයනවලට අදාළ මූල්‍ය ගලා ඒම අතර සාමාන්‍යයෙන් මසකට එ.ජ. ඩොලර් මිලියන 345ක් පමණ වන මෑතකාලීන පරතරය ගැටළුවක් වී ඇත.

**කාර්මික අපනයන:** කාර්මික භාණ්ඩ අපනයන ආදායම 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව, 2021 වසරේ අගෝස්තු මාසයේ දී සියයට 17.5කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා රෙදිපිළි හා ඇඟලුම්; ඛනිජ තෙල් නිෂ්පාදිත; රබර් නිෂ්පාදිත; ආහාර, පාන වර්ග සහ දුම්කොළ; සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ ප්‍රධාන කරගත් බොහෝ කාර්මික නිෂ්පාදිතවල අපනයන ආදායම පුළුල් ලෙස ඉහළ යෑම හේතු විය. සියලුම ප්‍රධාන වෙළඳපොළවල් වෙත සිදු කළ ඇඟලුම් අපනයන ඉහළ ගියේය. ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනවලින් ලැබෙන ආදායම ඉහළ යෑම සඳහා ගුවන් යානා සහ නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධන මිල ගණන් ඉහළ යෑම මෙන්ම, නැව් සඳහා යොදා ගනු ලබන ඉන්ධන අපනයන පරිමාවන් ඉහළ යෑම හේතු විය. රබර් නිෂ්පාදිතවලින් ලැබෙන ආදායම ඉහළ යෑම සඳහා ටයර් සහ අත්වැසුම්වලින් ලැබෙන ආදායම ඉහළ යෑම හේතු විය.

**කෘෂිකාර්මික අපනයන**: කෘෂිකාර්මික භාණ්ඩ සමස්ත අපනයන ආදායම, 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයේ දී සියයට 10.9කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් තේ, පොල් (මද ආශ්‍රිත මෙන්ම මද ආශ්‍රිත නොවන පොල් නිෂ්පාදිත), සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත

---

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.

(ප්‍රධාන වශයෙන් තල ඇට සහ පුවක්), මුහුදු ආහාර හා රබර් අපනයනයෙන් ලද ආදායම ඉහළ යෑම හේතු විය. 2021 වසරේ අගෝස්තු මාසයේ දී තේ අපනයන සඳහා වූ ඒකක මිල පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගිය ද, අපනයන පරිමාවන් ඉහළ යෑම තේ අපනයන ආදායම ඉහළ යෑමට හේතු විය. කුරුඳු අපනයනයෙන් ලැබූ ආදායම පහළ ගිය නමුත්, ගම්මිරිස්, කරාබු නැටි, සාදික්කා සහ වසාවාසි වැනි වෙනත් කුළුබඩුවලින් ලද ආදායම ඉහළ ගියේය.

**ඛනිජ අපනයන:** පාෂාණ සහ ගල් වර්ග; ලෝපස්, ලෝබොර සහ අළුවලින් ලද ආදායම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ අපනයන ආදායම 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයේ දී ඉහළ ගියේය.

**අපනයන දර්ශක:** 2021 වසරේ අගෝස්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සහ අපනයන ඒකක මිල දර්ශකය පිළිවෙළින්, සියයට 13.9කින් සහ සියයට 2.0කින් ඉහළ ගියේය. මෙමගින්, 2021 වසරේ අගෝස්තු මාසයේ දී අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාවන්වල බලපෑම ප්‍රධාන වශයෙන් හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | අගෝස්තු 2020 (එ.ජ.ඩො. මිලියන) | අගෝස්තු 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අගෝ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- අගෝ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **729.0** | **856.8** | **17.5** | **4,905.4** | **6,093.2** | **24.2** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 40.8 | 57.5 | 41.0 | 302.9 | 354.0 | 16.9 |
| සත්ත්ව ආහාර | 7.7 | 5.5 | -28.9 | 75.6 | 77.5 | 2.5 |
| රෙදිපිළි හා ඇඟලුම් | 440.0 | 493.3 | 12.1 | 2,853.1 | 3,434.8 | 20.4 |
| එයින්, ඇඟලුම් | 389.6 | 439.6 | 12.8 | 2,528.1 | 3,122.6 | 23.5 |
| රෙදිපිළි | 22.5 | 43.3 | 92.2 | 154.9 | 227.5 | 46.8 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 28.0 | 10.4 | -62.7 | 170.1 | 84.8 | -50.2 |
| රබර් නිෂ්පාදිත | 71.0 | 88.6 | 24.8 | 488.9 | 681.7 | 39.4 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 12.2 | 21.7 | 77.8 | 102.6 | 178.0 | 73.4 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 31.1 | 41.1 | 32.4 | 209.5 | 329.1 | 57.1 |
| ප්‍රවාහන උපකරණ | 7.1 | 9.5 | 32.7 | 46.2 | 74.8 | 61.8 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 22.0 | 46.3 | 110.7 | 268.1 | 294.9 | 10.0 |
| රසායනික නිෂ්පාදිත | 15.7 | 16.7 | 6.1 | 107.7 | 143.7 | 33.4 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 9.3 | 10.6 | 14.0 | 64.7 | 82.6 | 27.7 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.5 | 6.1 | 36.0 | 25.9 | 35.5 | 37.0 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.7 | 5.8 | 3.1 | 38.2 | 33.8 | -11.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 23.7 | 6.0 | -74.8 | 72.6 | 50.7 | -30.2 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 10.4 | 15.5 | 49.1 | 76.0 | 100.1 | 31.8 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 1.8 | 3.1 | 71.5 | 13.3 | 24.7 | 85.9 |
| වෙනත් කාර්මික අපනයන | 25.9 | 29.5 | 13.9 | 160.2 | 197.4 | 23.3 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **215.9** | **239.4** | **10.9** | **1,516.0** | **1,765.5** | **16.5** |
| තේ | 103.0 | 116.8 | 13.4 | 805.6 | 882.4 | 9.5 |
| රබර් | 1.5 | 3.7 | 149.1 | 17.9 | 27.3 | 52.7 |
| පොල් | 33.9 | 40.1 | 18.1 | 221.5 | 276.9 | 25.0 |
| කුළුබඩු | 39.7 | 39.7 | -0.1 | 194.5 | 282.4 | 45.2 |
| එළවළු | 5.2 | 2.2 | -56.9 | 26.1 | 18.4 | -29.7 |
| සකස් නොකළ දුම්කොළ | 4.9 | 2.6 | -46.3 | 16.9 | 21.4 | 26.6 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 12.1 | 15.7 | 29.9 | 100.3 | 91.1 | -9.1 |
| මුහුදු ආහාර | 15.6 | 18.6 | 19.6 | 133.2 | 165.5 | 24.3 |
| **3. ඛනිජ අපනයන** | **1.6** | **3.1** | **93.3** | **14.3** | **30.7** | **115.3** |
| **4. වර්ග නොකළ අපනයන** | **0.8** | **1.0** | **36.1** | **9.3** | **13.6** | **45.5** |
| **මුළු අපනයන** | **947.2** | **1,100.4** | **16.2** | **6,445.0** | **7,903.0** | **22.6** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2020 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,289ට සාපේක්ෂව, වෙළඳ භාණ්ඩ ආනයන වියදම 2021 වසරේ අගෝස්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,687ක් දක්වා සියයට 30.8කින් ඉහළ ගියේය.** රජය විසින් පනවා තිබූ ඇතැම් ආනයන සීමා තවදුරටත් ක්‍රියාත්මක වුවද, පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ සඳහා වූ ආනයන වියදමේ ඉහළ යෑමක් දක්නට ලැබුණි. සමුච්චිත පදනම මත, 2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා මුළු ආනයන වියදම, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,257ට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 13,411ක් ලෙස වාර්තා විය.

**පාරිභෝගික භාණ්ඩ:** 2021 වසරේ අගෝස්තු මාසයේ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම සියයට 12.3කින් ඉහළ ගිය අතර (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත), ඒ සඳහා මූලික වශයෙන් එළවළු (ප්‍රධාන වශයෙන් පරිප්පු සහ ළූණු), කිරි නිෂ්පාදිත (කිරි පිටි), මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන් වියළි හාල්මැස්සන් සහ ශීත කළ මාළු), කුළු බඩු (මිරිස්) සහ අවශේෂ ආහාර හා පාන වර්ග ආනයන ඉහළ යෑම හේතු විය. සීනි ආනයන වියදමේ සැලකිය යුතු අඩු වීමක් දක්නට ලැබුණි. මේ අතර, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 67.5කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගිය අතර, මේ සඳහා එන්නත් ආනයන වියදම ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සඳහා ගෘහ උපකරණ, විදුලි සංදේශ උපාංග, රෙදිපිළි සහ උපාංග, රබර් නිෂ්පාදිත, ගෘහ සහ දැව භාණ්ඩ ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවල ප්‍රධාන කාණ්ඩ කිහිපයක ආනයන වියදම ඉහළ යෑමද හේතු විය.

**අන්තර් භාණ්ඩ:** ඉන්ධන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංගවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව සියයට 27.6කින් ඉහළ ගියේය. පිරිපහදු කළ ඛනිජ තෙල් සහ බොරතෙල් ආනයන පරිමාවන් පහළ ගිය ද ඒවායේ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයේ දී ඉන්ධන ආනයන වියදම සියයට 42.5කින් ඉහළ ගියේය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත). බොරතෙල් බැරලයක් සඳහා වූ ආනයන වියදම, 2020 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 47.74ට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයේ දී එ.ජ. ඩොලර් 74.88ක් විය. පොහොර ආනයන වියදමේ කැපී පෙනෙන පහළ යෑමක් දක්නට ලැබුනු අතර එමගින් පොහොර සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි බලපෑම පිළිඹිබු වේ.

**ආයෝජන භාණ්ඩ:** 2021 වසරේ අගෝස්තු මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 30.8කින් ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කාණ්ඩය යටතේ පරිගණක වැනි කාර්යාලයීය උපකරණ, වෛද්‍ය සහ විද්‍යාගාර උපකරණ, කෘෂිකාර්මික උපකරණ, විදුලි මෝටර සහ විදුලි උත්පාදන කට්ටල සහ අවශේෂ කාර්මික උපකරණ ආනයන වියදමේ සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ, යකඩ හා වානේ උපාංග සහ ඛනිජ නිෂ්පාදිත (මූලික වශයෙන් ඇස්බැස්ටෝස්) ආනයන හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ

---

[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.
.

ගියේය. ආනයන පරිමාව පහළ යෑම හේතුවෙන් සිමෙන්ති ආනයන වියදම අඩු වූ අතර, කුඩා ගුවන් යානා සහ කෘෂිකාර්මික ට්‍රැක්ටර් ආනයනය හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ ගියේය.

**ආනයන දර්ශක:** 2021 වසරේ අගෝස්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක පිළිවෙළින් සියයට 3.6කින් සහ සියයට 26.3කින් ඉහළ ගියේය. මෙමගින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආනයන මිල ගණන් හේතු වූ බව නිරූපණය වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2020 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) | 2021 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජනවාරි - අගෝස්තු 2020 (එ.ජ.ඩො. මිලියන) | ජනවාරි - අගෝස්තු 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **228.6** | **324.3** | **41.8** | **2,300.3** | **2,579.3** | **12.1** |
| ආහාර හා පාන වර්ග | 106.1 | 119.1 | 12.3 | 1,023.7 | 1,151.9 | 12.5 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.0 | 2.3 | -21.7 | 21.0 | 24.4 | 16.1 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 23.0 | 30.6 | 32.9 | 228.9 | 231.2 | 1.0 |
| එළවළු (ආ) | 18.4 | 36.1 | 96.9 | 246.3 | 278.7 | 13.1 |
| මුහුදු ආහාර | 12.7 | 14.8 | 17.2 | 139.5 | 82.5 | -40.8 |
| සීනි හා රසකැවිලි | 18.5 | 3.2 | -82.8 | 162.6 | 211.3 | 30.0 |
| කුළුබඩු | 8.0 | 9.8 | 22.4 | 84.2 | 90.5 | 7.6 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.65 | 22.3 | -1.6 | 141.2 | 233.3 | 65.2 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 122.5 | 205.1 | 67.5 | 1,276.7 | 1,427.3 | 11.8 |
| පෞද්ගලික රථවාහන | 1.3 | 1.1 | -13.6 | 280.8 | 7.8 | -97.2 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 47.6 | 98.5 | 106.8 | 385.3 | 532.0 | 38.1 |
| ගෘහ උපකරණ | 8.6 | 16.5 | 91.6 | 100.4 | 179.8 | 79.1 |
| රෙදිපිළි හා උපාංග | 13.2 | 18.5 | 39.8 | 137.6 | 138.7 | 0.8 |
| විදුලි සංදේශ උපකරණ | 27.6 | 32.8 | 18.7 | 174.6 | 283.1 | 62.2 |
| ගෘහ හා දැව භාණ්ඩ | 10.4 | 13.4 | 28.6 | 91.6 | 103.6 | 13.1 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 13.7 | 24.3 | 77.7 | 106.4 | 182.4 | 71.4 |
| **2. අන්තර් භාණ්ඩ** | **791.3** | **1,010.0** | **27.6** | **5,692.4** | **7,942.4** | **39.5** |
| ඉන්ධන | 247.5 | 352.7 | 42.5 | 1,691.2 | 2,395.9 | 41.7 |
| එයින්, බොරතෙල් | 69.3 | 107.7 | 55.4 | 387.6 | 516.4 | 33.2 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 178.2 | 245.0 | 37.5 | 1,174.4 | 1,748.3 | 48.9 |
| ගල්අඟුරු | 0.0 | 0.0 | -49.1 | 129.2 | 131.2 | 1.6 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 7.9 | 6.8 | -14.6 | 57.4 | 81.7 | 42.3 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 194.4 | 241.3 | 24.1 | 1,457.2 | 1,943.7 | 33.4 |
| කඩදාසි හා ඝන කඩදාසි | 30.5 | 37.5 | 22.7 | 239.5 | 319.4 | 33.4 |
| කෘෂිකාර්මික යෙදවුම් | 14.6 | 25.0 | 71.0 | 132.5 | 187.3 | 41.3 |
| තිරිඟු හා ඉරිඟු | 46.0 | 55.0 | 19.4 | 229.3 | 265.9 | 15.9 |
| මූල ලෝහ | 39.0 | 39.6 | 1.5 | 246.6 | 499.2 | 102.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 48.9 | 54.5 | 11.5 | 323.9 | 518.6 | 60.1 |
| රසායනික නිෂ්පාදිත | 65.3 | 80.1 | 22.6 | 518.3 | 732.6 | 41.3 |
| පොහොර | 8.2 | 0.9 | -88.7 | 124.3 | 104.0 | -16.4 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 17.0 | 35.4 | 108.3 | 145.8 | 265.8 | 82.3 |
| ඛනිජ නිෂ්පාදිත | 14.3 | 17.7 | 23.6 | 107.6 | 106.1 | -1.4 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 57.5 | 63.6 | 10.6 | 418.7 | 522.4 | 24.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **269.0** | **351.7** | **30.8** | **2,253.2** | **2,882.3** | **27.9** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 177.6 | 224.0 | 26.1 | 1,324.6 | 1,822.5 | 37.6 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 82.0 | 97.5 | 18.9 | 671.4 | 803.9 | 19.7 |
| ප්‍රවාහන උපකරණ | 9.1 | 29.6 | 224.5 | 255.3 | 252.1 | -1.2 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.2 | 0.5 | 142.0 | 2.0 | 3.7 | 90.6 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.2** | **0.8** | **312.3** | **11.4** | **7.6** | **-33.8** |
| **මුළු ආනයන** | **1,289.1** | **1,686.7** | **30.8** | **10,257.4** | **13,411.5** | **30.7** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,041.6** | **1,334.0** | **28.1** | **8,566.1** | **11,015.6** | **28.6** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු විය.** 2020 වසරේ අගෝස්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 664ක් වූ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 447ක් විය. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.8ක සුළු පහළ යාමක් පෙන්නුම් කරමින්, 2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත ප්‍රේෂණ ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 4,224ක් විය.

**පෙර මාසයට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයේ දී සංචාරක පැමිණීම් යම් වර්ධනයක් පෙන්නුම් කළේය.** ඒ අනුව, 2021 වසරේ ජූලි මාසයේ 2,429ක් වූ සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2021 වසරේ අගෝස්තු මාසයේ දී පැමිණි සංචාරකයින් ප්‍රමාණය 5,040ක් ලෙස වාර්තා විය. 2021 වසරේ අගෝස්තු මාසය දක්වා වූ මාස අට තුළ පැමිණි 24,377ක් වූ සංචාරකයින් ප්‍රමාණයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැමිණි මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය 507,311ක් ලෙස වාර්තා විය. 2021 වසරේ අගෝස්තු මාසය තුළ වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණි රටවල් වූයේ කැනඩාව, ජර්මනිය සහ එක්සත් රාජධානියයි. 2021 වසරේ අගෝස්තු මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 7ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2021 වසරේ අගෝස්තු මාසය දක්වා වූ මාස අට තුළ සමස්ත සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 33ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලර් මිලියන 682ක් විය.

**රූප සටහන 9: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 10: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## විවිධ ආයෝජන ප්‍රවාහ

2021 වසරේ අගෝස්තු මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය. 2021 වසරේ අගෝස්තු මාසය දක්වා වූ මාස අට තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 26ක සමස්ත ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජන ප්‍රමාණය 2021 වසරේ අගෝස්තු මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 10ක අඩු මට්ටමක පැවතුණි. මේ අතර, 2021 වසරේ අගෝස්තු මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 16ක ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2021 වසරේ අගෝස්තු දක්වා වූ මාස අට තුළ එ.ජ. ඩොලර් මිලියන 181ක ශුද්ධ ගෙවීමක් සිදු විය.

## ජාත්‍යන්තර සංචිත

**2021 වසරේ ජූලි මාසය අවසානය වනවිට පැවති එ.ජ. ඩොලර් බිලියන 2.8ක් වූ දළ නිල සංචිත ප්‍රමාණය 2021 වසරේ අගෝස්තු මාසය අවසානය වනවිට එ.ජ. ඩොලර් බිලියන 3.5ක් දක්වා ඉහළ ගියේය.** ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වි.ගැ.හි. වෙන් කිරීම් යටතේ ලැබීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව සහ බංගලාදේශ බැංකුව අතර ඇති කරගත් ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු ගිවිසුම යටතේ මූලික අදියරේ ලැබීම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම දළ නිල සංචිත මට්ටම තුළ චීන මහජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කළ චීන යුවාන් බිලියන 10ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5ක) තුන් අවුරුදු ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම ඇතුළත් නොවේ. මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2021 වසරේ අගෝස්තු මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 7.3ක් වූ අතර, එම ප්‍රමාණය මාස 4.6ක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් වේ.

**රූප සටහන 11: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**අන්තර් බැංකු වෙළඳපොළේ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය 2021 වසරේ අගෝස්තු මාසයේ දී සමස්තයක් ලෙස ස්ථාවරව පැවති අතර, මාසය අවසානයේ දී විනිමය අනුපාතිකය මත යම් පීඩනයක් දක්නට ලැබුණි.** අගෝස්තු මාසය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 4.8කින් අවප්‍රමාණය විය. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අගෝස්තු මස අවසාන භාගයේදී අත්‍යවශ්‍ය ආනයනවලට අදාළව ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් අවශ්‍ය වීම වන අතර, එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වී විදේශ විනිමය සැපයීමට සිදුවිය. 2021 වසරේ ඔක්තෝබර් 18වන දින දක්වා කාලය තුළ රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.8කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2021 වසරේ ඔක්තෝබර් 18වන දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල, යුරෝ, ස්ටර්ලින් පවුම, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ජපන් යෙන්වලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. මේ අතර, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක මගින් පිළිබිඹු වන පරිදි ශ්‍රී ලංකා රුපියල මේ වන විට සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වී ඇත.

**රූප සටහන 12: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම**

| මුදල් ඒකකය | 2019 | 2020 | 2021 (ඔක්තෝබර් 18 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | +0.6% | -2.6% | -6.8% |
| යුරෝ | +2.6% | -11.2% | -1.1% |
| ස්ටර්ලින් පවුම | -2.8% | -6.2% | -7.5% |
| ජපන් යෙන් | -1.0% | -7.5% | +3.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | +1.3% | -11.4% | -3.2% |
| ඉන්දියානු රුපියල | +2.6% | 0.0% | -4.5% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම I:**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | අගෝස්තු 2020 (එ.ජ.ඩො. මිලියන) | අගෝස්තු 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-අගෝ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- අගෝ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **214.2** | **241.4** | **12.69** | **1,582.3** | **1,795.6** | **13.5** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 17.3 | 20.6 | 19.25 | 149.7 | 191.7 | 28.1 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 4.4 | 5.2 | 16.59 | 41.7 | 44.2 | 6.0 |
| 05 එළවළු හා පලතුරු | 40.6 | 46.7 | 14.90 | 267.6 | 299.1 | 11.8 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 138.7 | 152.6 | 9.98 | 978.8 | 1,138.7 | 16.3 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **14.8** | **14.6** | **-1.15** | **74.0** | **89.9** | **21.5** |
| 11 පාන වර්ග | 2.4 | 3.4 | 44.37 | 20.4 | 20.4 | -0.3 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 12.4 | 11.2 | -9.77 | 53.6 | 69.6 | 29.8 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **32.6** | **37.6** | **15.35** | **230.1** | **284.5** | **23.6** |
| 23 සකස් නොකළ රබර් | 1.6 | 3.8 | 143.52 | 18.4 | 28.0 | 51.5 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 23.9 | 21.3 | -10.90 | 145.7 | 160.4 | 10.1 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **22.0** | **46.3** | **110.66** | **268.1** | **294.9** | **10.0** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 22.0 | 40.0 | 82.02 | 255.5 | 258.0 | 1.0 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 0.0 | 6.3 | ... | 12.6 | 36.9 | 191.9 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **10.6** | **13.7** | **29.83** | **56.1** | **83.0** | **48.1** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 9.1 | 7.7 | -15.19 | 46.7 | 54.7 | 17.1 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **21.4** | **23.9** | **11.67** | **140.4** | **187.8** | **33.8** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **122.0** | **156.7** | **28.43** | **868.8** | **1,095.4** | **26.1** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 47.9 | 56.9 | 18.95 | 340.6 | 439.3 | 29.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 42.8 | 52.0 | 21.50 | 293.6 | 297.6 | 1.4 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 15.7 | 27.2 | 73.72 | 123.9 | 216.5 | 74.7 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **36.2** | **48.6** | **34.36** | **246.5** | **392.8** | **59.4** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 23.4 | 27.0 | 15.10 | 151.6 | 212.7 | 40.3 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **473.5** | **517.6** | **9.31** | **2,978.8** | **3,678.7** | **23.5** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 434.3 | 475.3 | 9.44 | 2,736.9 | 3,388.9 | 23.8 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.0** | **0.0** | **...** | **0.0** | **0.3** | **5,829.1** |
| **මුළු අපනයන** | **947.2** | **1,100.4** | **16.17** | **6,445.0** | **7,903.0** | **22.6** |

(අ) තාවකාලික
... ඉතා සුළු

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක් වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | අගෝස්තු 2020 (එ.ජ.ඩො. මිලියන) | අගෝස්තු 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අගෝ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.- අගෝ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **160.93** | **194.2** | **20.7** | **1,385.5** | **1,534.0** | **10.7** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 23.0 | 30.7 | 33.1 | 229.2 | 231.5 | 1.0 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 12.7 | 14.9 | 17.2 | 140.1 | 83.2 | -40.6 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 48.8 | 57.5 | 17.9 | 249.2 | 288.6 | 15.8 |
| 05 එළවළු හා පලතුරු | 22.4 | 40.5 | 80.5 | 289.5 | 324.0 | 11.9 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 18.5 | 3.2 | -82.8 | 162.6 | 211.3 | 30.0 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 10.6 | 12.2 | 15.5 | 107.4 | 117.1 | 9.0 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **9.13** | **9.8** | **7.3** | **67.4** | **51.0** | **-24.3** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **28.43** | **47.1** | **65.8** | **301.0** | **380.5** | **26.4** |
| 23 සකස් නොකළ රබර් | 13.88 | 31.0 | 123.0 | 122.3 | 233.8 | 91.2 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 3.02 | 1.1 | -62.5 | 62.6 | 14.5 | -76.8 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **247.51** | **352.7** | **42.5** | **1,691.2** | **2,395.9** | **41.7** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 224.21 | 306.1 | 36.5 | 1,402.7 | 2,030.6 | 44.8 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 23.27 | 46.5 | 99.9 | 159.3 | 234.1 | 46.9 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **21.93** | **17.6** | **-19.8** | **111.2** | **211.3** | **90.1** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 21.66 | 15.7 | -27.7 | 106.2 | 194.1 | 82.8 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **168.37** | **229.7** | **36.4** | **1,330.4** | **1,860.4** | **39.8** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 43.1 | 93.2 | 116.3 | 357.7 | 491.2 | 37.3 |
| 56 පොහොර | 8.2 | 0.9 | -89.2 | 124.2 | 103.5 | -16.7 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 33.5 | 38.9 | 16.2 | 214.1 | 382.0 | 78.4 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 13.5 | 12.8 | -5.2 | 90.8 | 112.0 | 23.3 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **369.89** | **448.2** | **21.2** | **2,750.0** | **3,787.3** | **37.7** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 30.1 | 35.9 | 19.4 | 232.3 | 305.5 | 31.5 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 190.8 | 238.6 | 25.0 | 1,393.1 | 1,907.5 | 36.9 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 43.5 | 43.1 | -1.1 | 338.4 | 337.0 | -0.4 |
| 67 යකඩ හා වානේ | 47.9 | 55.3 | 15.4 | 335.7 | 612.5 | 82.5 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **225.05** | **304.0** | **35.1** | **2,105.0** | **2,563.1** | **21.8** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 30.66 | 51.6 | 68.2 | 258.2 | 435.5 | 68.7 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 39.3 | 49.6 | 26.3 | 314.9 | 413.8 | 31.4 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 16.9 | 32.8 | 93.5 | 123.5 | 218.7 | 77.1 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 48.6 | 55.4 | 14.1 | 310.6 | 543.6 | 75.0 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 47.6 | 62.6 | 31.5 | 343.0 | 485.5 | 41.5 |
| 78 රථවාහන | 14.6 | 23.9 | 64.1 | 473.3 | 239.0 | -49.5 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **57.53** | **82.6** | **43.5** | **505.7** | **619.3** | **22.5** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 10.73 | 15.9 | 47.9 | 116.0 | 117.2 | 1.0 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 14.79 | 21.2 | 43.1 | 120.5 | 157.3 | 30.5 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.32** | **0.8** | **139.3** | **10.2** | **8.7** | **-14.1** |
| **මුළු ආනයන** | **1,289.09** | **1,686.7** | **30.8** | **10,257.4** | **13,411.4** | **30.7** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක් වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf